## 477 ධීවරයෝ

ධීවරයෝ මගෙ හොඳ මිතුරෝ
ඔබ මින් මතු අල්ලන්නේ
මසුන් නොවේ මිනිසුන් වේ
මින් මතු අල්ලන්නේ මිනිසුන් වේ

වෙරළේ තිබුණා පොඩි ඔරුවක්
ඒ මත නැගලා නැතිව බියක්
දියපත් කරනට සැහෙන දුරක්
සීමොන් හට ඔබ දුන්නෙ අණක්

ගැඹුරට දමනුය දැල නුඹගේ
තව තව ගැඹුරට රළ ඔස්සේ
අසුවෙයි මාළුන් සැකක් නැතේ
ඔරුවත් මිදිවෙයි සොයුර නුඹේ

ඔරු දෙක පිරුණා බරට බරයි
ගිලිලා යයිදෝ අපට සැකයි
කිසිදා අසු නොවූ මාළු ගොඩයි
අසුවුනෙ මෙදිනේ හරි පුදුමයි